


# හුළං

මේ දවස්වල මෙල්බර්න් වලට හරි හුළං ! කොටට කපාගත්ත කොණ්ඩේ අත ගගා පැන්සල කිව්වා

"කොණ්ඩෙ කපන්ඩද ඊයේ නිවාඩු දැම්මෙ ?" පින්සල කණ්ණාඩිය ළඟට ගියේ කොණ්ඩෙ කපන්න තරමට වැවිලද කියලා බලන්න වගේ.

එළියේ පොඩි ඇවිදිල්ලකට ගිය පන්හිඳත් ගෙට ගොඩවුණේ ඔය වෙලාවෙ.

"එළියේ හරි හුළං !" පන් කොණ්ඩය හදන්න දඟලන හැටි දැකලා පැන්ටයි, පින්ටයි හරි හිනා.

තට්ටෙ වහගන්න කියලා බාබර් තුමා හැමදම ඉස්සරහිං කොණ්ඩ කැරැල්ලක් ඉතුරු කරනවා. හුළං කාලෙට හරිම කරදරයි..." පන් හිනාවෙන අයට නොක්කාඩුව කිව්වා.

"අද හුළං හමන්නෙ උතුරට ද කොහෙද ? පන්ගේ කොණ්ඩෙ බලපුවම හුළං අත බලාගන්න පුළුවං ... !" පැන් හිනා වුණා.

"හුළං හන්ද තියෙන කරදරයක් ! " පින් කිව්වා.

"එහෙම කියන්න එපා. අපි හුස්ම ඩිංග ගන්නෙත් හුළං හන්දනේ. අනික මොන තරං දේවල් හුළඟේ හැංගිලා තියෙනව ද? " ඒ පන්.

"පාවී පාවී මේ එන්නේ
අතීතයේ හිට එන සුළඟයි ! "

ටී. එම්. ජයරත්න මහත්තයා ගායනා කරපු සින්දුවක් පින් තාලෙට කිව්වා ..."

"පාවී පාවී මේ එන්නේ
ලංකාවේ හිට එන සුළඟයි ! "

පන් ඒ තාලෙට ම තමන්ගෙ ශිතට ආව විදියට වචනයක් වෙනස් කරලා කිව්වා.

"මේ හුළඟේ බුදු බණ පවා රැඳිලා තියෙනවාය කියලානේ කියන්නේ " සින්දු කියන්න දන්නැති පැන් විද්‍යාවට සම්බන්ධ කියමනක් කිව්වා. " ඒ කාලෙ උන්න දේශකයන්ගේ, දාර්ශනිකයින්ගේ කට හඬවල් හුළඟෙ රැඳිලා තියෙනවලු. ඒ දේවල් පෙරලා අරගෙන අපට අහන්න සළස්වන්න විද්‍යාඥයෝ පර්යේෂණ කරනවාය කියන්නෙ ...."

"හොඳ අයගේ හොඳ දේවල් නං හොද ..." පින් කිව්වා.

"ඒ කියන්නේ අපේ අය කියපු දේවල් හුළඟෙ ගියා කියලා දුක්වෙන්න දෙයක් නෑ ..." ඒ පන්.

"හුළඟේ තියෙන දේවල් හොයලා නොගත්තත්, පොත් පත් වල ලියවිලා, හඬ පටිවල, සංගත තැටිවල, කොම්පියුටර් වල තැන්පත් වෙලා තියෙන හොඳ දේවල් මදි ද මිනිසුන්ට හැදෙන්න ? හැදෙන විදියක් ගැන හිතන්න ?"

"දැන් බලන්න, අර පහුගිය ද අන්තරා වුණා විජේරත්න රණතුංග මහත්තයාගේ සාකච්ඡාව ? පන්ගේ හඬ පටිය වාදනය කළාම ඒ අංසේ දේවල් ගැන හොඳ කරුණු ටිකක් කිය-වෙනවා. ඒ මහත්තයාගේ තබ්ලා වාදන වුණාත් ඔය විදියට පටි වල, තැටිවල සද්දෙ විදියට, දර්ශන විදියට රැඳිලා ඇතිනේ. ඉගෙනගන්න උනන්දු වෙන කෙනෙකුට ඒ මදිද ?"

"ඒ වාගේ දේවල් රැකගන්න එකත් ලොකු දෙයක්. පහුගිය සති අන්තෙ තිබුණ ඇන්ජලින් ගුණතිලක මහත්මියගේ ප්‍රසංගයේ තිරය පුරා ඒ කාලේ චිත්තරපටිවල දර්ශන පෙන්නුවා. දැන් ජෝ අබේවික්‍රම මහත්තයා නැති වුණා. ඒ අය ඇත්තටම නැති වුණා වුණාත් ඒඅ ය කරපු කියපු දේවල් රැකගන්න එක හරි වටිනවා. එතකොට අඩු ගානේ ඒ දේවල් නැති වුණා වෙන්නෙ නෑනෙ."

"අපේ කීපදෙනෙක් ඔය දේවල් තේරුං අරගෙන රැකගන්නවා. ඒත් ඒ අයගෙන් පස්සෙ ?"



"ඒ අයවත් රැකගන්න එක, ඒ අය රැකගත්ත දේ රැකගන්න එක ජාතික වටිනාකමක් තියෙන වැඩක්."

"සමහර දර්ශනිකයෝ තමන්ගේ දේවල් ලියලා තිබ්බා. මේ ළඟදි මට හම්බවුණා ලෙනාඩො ඩා වින්චි ගේ ලියවිලි වලින්ම පිරුණ පොතක්. අත් පිටපත් වල තිබුණ හැමදෙයක්ම වාගේ ඉංග්‍රීසියට හරවලා. පොතේ නම "LEONARDO DAVINCI — THA CODEX LEICESTER" (ලෙනාඩෝ ඩා වින්චි " ද කොඩෙක්ස් ලීසෙස්ටර්) පැන්සල දිග කතාවකට මුල පිරුවා. පැන් ඩා වින්චි තුමාගේ රසිකයෙක්, පාඨකයෙක්, අනුගාමිකයෙක්.

"ලෙනාඩෝ ව හැමෝම දන්නෙ "මොනාලිසා" කියන චිත්‍රය ඇඳපු චිත්‍ර ශිල්පියා විදියට. ඒ වුණාට ලෙනාඩෝ දර්ශනිකයෙක් විදියට, ඉංජිනේරුවෙක් විදියට, වෛද්‍ය විද්‍යාවට අයිති කායික විද්‍යාව හදරපු කෙනෙක් විදියට දන්නේ කී දෙනාද? ලෙනාඩෝ ලෝකෙට දුන්න වටිනාම දේවල් මොනාලිසාගේ ගුප්ත හිනාවට යටවෙලා. ඒක ලෝකෙ හැටි. සුන්දර දේට කවුද ආස නැත්තෙ ? ඒකනේ කලාව ලෝකෙ පුරා ඔය හැටි ජනප්‍රිය වෙලා තියෙන්නෙ. ඒ වුණාට ලෝකෙ මේ ගමන ඇවිත් තියෙන්නෙ කලාව හන්දමත් කලාකාරයෝ හන්දමත් නෙවි. තමන්ගේ ජිවිතය ගැනවත් නොහිතා ලෝකෙට ඇත්ත කියා දෙන්න දඟලපු ගැලිලියෝ ගැලිලි, අයින්ස්ටයින්, අයිසැක් නිව්ටන් වාගේ විද්‍යාඥයෝ, ගණිතඥයෝ, දර්ශනිකයෝ හන්ද. ඒත් ඒ අයට වඩා මොනාලිසා ජනප්‍රියයි. ලෝකයේ ජනප්‍රියම, ප්‍රකටම නම "මොනාලිසා" කියලනෙ කියන්නෙ."

"ලෙනාඩෝ තමන් දැකපු, නිර්මාණය කරපු, අවබෝධ කරගත්ත හැමදෙයක්ම සටහන් විදියට ලියලා තිව්වා. තමන්ට අඳින්න පුළුවන් හන්ද ඇඳලාත් තිව්වා. ඒ වාගේ දේවල් වලින් තමයි විද්‍යාව බිහිවුණේ. ඒ නව තාක්ෂණය සමහර වෙලාවට අපේම විනාශයට හේතුවෙනවා තමයි. ඒ වුණත් මුළු ලෝකය පුරාම තියෙන හැම විද්‍යාවක්ම, හැම කලාවක්ම, හැම ශිල්පයක්ම, හැම නිර්මාණයක්ම රැකගන්නට පවත්වාගෙන යන්න වැඩි දියුණු කරන්න තාක්ෂණය පිහිට වෙනවා.

"අපේ රටේ උන්න ආතර් සී. ක්ලාක් තුමා ගැන කවුද කතාකරන්නෙ ? සිරිල් පොන්නම්පෙරුම වගේ විද්‍යාඥයෝ ගැන කවුද දන්නෙ. අඟහරු ලෝකෙට යවපු යානයේ කැමරා කාචය හැදුවෙ සිංහල විද්‍යාඥයෙක් කියලා කීයෙන් කී දෙනා ද දන්නෙ ? ඒ අය බොහොම නිහඬ සේවයක් කරන්නෙ. සිනමා තිරයක මල් ගස් වටේ දුවන නිළියක් වෙනුවෙන් පත්තර පිටු පිරුණට අර වාගෙ අය ගැන කවුද ලියන්නෙ? ලියන අයට වැටහීමක් නැති එකත් එක ප්‍රශ්ණයක්." හැබැයි දියුණු රටවල් වල ඔය හැම දෙයක් ගැනම ලියනවා. ඒකනේ ඒ අය දියුණු.

"ලෙනාඩෝ ගේ මොනලිසා ගැන කතා කරන අය එතුමාගේ කාය විච්ඡේදන රූප ගැන හරි, යාන්ත්‍රික රූප ගැන හරි අහලාවත් තියෙනවද කියලා හිතෙනවා. හැම දෙයක්ම සෞන්දර්යටම යට වෙලා. සුන්දරත්වයට හැම දෙනෙක්ම වසඟ වෙනවා. ඇත්ත කල්පනාවෙන්නේ ඉසකෙයා ටික හුළඟෙ ගිහින් තට්ටය මතුවෙන කොට ...." පන්හිඳ හිස අතගාන ගමන් පැන්සලට පොඩි විරාමයක් අරන් දුන්නා.

"දැන් මේ අයගේ මේ දේවල් රැකගන්න එකත් තාක්ෂණයටම බාර වෙලා. අන්තර් ජාලයේ නැති දෙයක් තියෙනවද අද ? "ගූගල්" එකට ගිහින් හොයලා බලන්න. මොනවද නැත්තෙ ?" පැන් ඒ විරාමයට විරාමයක් දුන්නා.

"අන්තිමට බලනකොට අන්තර් ජාලෙ වුණත් අපේ ගෙවල් වලට එන්නෙ හුළං වලට පිහිට වෙන්න" පැන් කොහේද යන්න එළියට බැස්සා. ගස් වැල් කරකවාගෙන ආව හුළඟට පැන්ගේ කොණ්ඩෙ අවුල් වුණෙ නෑ. ඒ කොටට කපලා තිබුණ හන්ද.

"හුළං තමා හුළං ! හුළඟට දෙර හයියෙන් වැහෙන්න කලියෙන් පින්සල දෙර වැහුවා. හුළං තමා හුළං !

18 වන පිටෙන්

සඳහා පුහුණුකරුවන් අඩුයි. එනිසා බොහේ වේලාවට කුඩා දරුවන් පුහුණුවන්නේ තම දෙමාපියන්ගේ උපදෙස් හා හැකියාවන් අනුවයි. මෙහිදී නිසි තාක්ෂණයට අනුකූල පුහුණුවක් ඔවුන්ට ලැබෙන්නෙ නැහැ. මම පුරවන්න හදන්නෙ ඒ හිස්තැනයි. මේ අපි ඉහත සාක්ච්ඡා කළ අඩුව ඔස්ට්‍රේලියානු ක්‍රිකට් බලධාරීන් පවා තේරුම් ගත්ත එකක්. එනිසා තමයි මට බොහෝ විට කණිෂ්ඨ ක්‍රිඩකයන් පුහුණු කරන ලෙස ආරාධනා ඔවුන් වෙතින් ලැබෙන්නෙ.

**අපේ සමාජයේ මතයක් තියෙනවා ඔස්ට්‍රේලියානු කණ්ඩායමට ආසියාතිකයන් ඇතුළත් කර ගන්නෙ නැහැ ය කියලා. හිතා මතා කරන නොසැළකීමක් තියෙනවා තියෙනවා කියලා. මේ ගැන ඔබේ අදහස මොකක්ද?**

මගේ අදහස අනුව මේ කාරණය පිටිපස්සෙ තියෙන්නෙ වෙනත් හේතුවක්. ජාත්‍යන්තර තලයේ ක්‍රිඩකයකු බිහිවෙන්නෙ කුඩා කාලයේ සිටම නිසි තාක්ෂණයට අනුව පුහුණුව ලැබීමෙනුයි. පාසලෙන් පසුවත් ක්‍රිකට් ක්‍රීඩාවේ දිගටම නියැලෙමින් අවශ්‍ය තාක්ෂණය ගොඩනගා ගන්න අවශ්‍යයි. අපේ අය අතරින් මේ දුර ගමන යන්න කැපවීමක් සහ උනන්දුවක් පෙන්වන අය අඩුයි. බොහෝ විට අපේ ක්‍රිඩකයන් අතරමග නවතිනවා. මේක පැහැදිලිවම අපට පේනවා මෙහි ක්‍රිකට් සමාජ වලට බැඳී ක්‍රීඩා කරන අපේ ක්‍රීඩකයන් ගේ සංඛ්‍යව දෙස බලපුවහම. ජාත්‍යන්තර තලයට එන්නට නම් ක්‍රිකට් සමාජ වලත් සෑහෙන කාලයක් ක්‍රිඩා කරන්න වෙනවා.

වැදගත්ම දේ මුල සිටම නිසි මගපෙන්වීමක් යටතේ පුහුණුව ලැබීමයි. මම උත්සාහ කරන්නේ අපේ ක්‍රීඩකයන් කීප දෙනෙක් හෝ ඔස්ට්‍රේලියා ජාතික කණ්ඩායම දක්වා ජාත්‍යන්තර තලයට ගෙන යාමටයි. ඒ සඳහා අවශ්‍ය දැනුමත් ශක්තියත් මට තිබෙන බවට දැඩි ආත්ම විශ්වාසයක් මට තියෙනවා. ඒ නිසයි මම මේ කාර්යයට අත ගැහුවෙ.

**මේ පන්තිය පවත්වන ස්ථාන මොනවාද?**

දැනට සවුත් මොරෑන්ග් සහ තෝමස්ටවුන් යන ස්ථාන වල පුහුණු කිරීම් පවත්වන්න කටයුතු සූදානම් කරලා තියෙනවා. එළිමහන් හා ගෘහස්ථ පුහුණු සැසිවාර පවත්වන්නට සැළසුම් කර තිබෙනවා.

**මේ පුහුණුව පවත්වන්නෙ මොන ආකාරයටද?**

වයස් කාණ්ඩ අනුව බෙදා පහුණුවීම් පවත්වනවා. වයස 11 න් පහළ 13 න් පහළ 15න් පහළ 17න් පහළ සහ වැඩිහිටි වශයෙන්. කණ්ඩායම් ලෙසත් තනි තනිවත් මේ පුහුණුවීම් කෙරෙනවා. ඒ වගේම මෙහේ දැනට පවත්වාගෙව යන ශ්‍රී ලාංකික ක්‍රිකට් කණ්ඩායම් සඳහාත් පහුණුවීම් කරන්න මම සූදානම්. වැඩි විස්තර සඳහා මගේ අංක 0458 777 034 දුරකතනයට අමතන ලෙස ඉල්ලා සිටිනවා.

දුලිප් ලියනගේ ඉතා කැපවීමකින් සිය යුතුකම් ඉටු කරන ක්‍රිඩකයෙකි. ඒ බව සනාථ කරන සාධක එමටය. එවැනි දක්ෂ පුහුණුකරුවකු යටතේ පුහුණුව ලබන්නට වාසනාව අපේ දරුවන්ට ලැබීම අපට සතුටකි. මේ මහඟු අවස්ථාවෙන් නිසි ඵල නෙලා ගැනීමට බුද්ධිමත් වන්නැයි අපි ද ඔබෙන් ඉල්ලා සිටින්නෙමු.

Sannasa Online
www.sannasa.net
www.sannasa.com